**චක්‍රලේඛය 2018 අංක 02** 2018 ඔක්තෝබර් 11

## ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි මත සිදුකරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතා

ආනයන සීමා කිරීම හා විනිමය අනුපාතයට අහිතකර බලපෑමක් ඇති කිරීම අවම කිරීමේ අරමුණින් ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි පාදකව සිදු කරන ආනයන සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතු වේ.

1. ඇමුණුම (1) හි සඳහන් භාණ්ඩ ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ පදනම මත ආනයනය සඳහා ආනයනකරු විසින් ඉන්වොයිසියේ වටිනාකම මෙන් සියයට 100 ක ආන්තිකයක් අදාළ ලේඛන භාර ගන්නා අවස්ථාවේදී එම ලේඛන නිදහස් කරන බැංකුවෙහි තැබිය යුතුය.
2. එකම ඉන්වොයිසියක ආන්තික අවශ්‍යතාවයට යටත් නොවන භාණ්ඩ ඇතුළත් වුවද 100% මුදල් ආන්තික අවශ්‍යතාවයක් ඉන්වොයිසියේ සමස්ත වටිනාකම මත තැබිය යුතුය.
3. ඉන්වොයිසිය සඳහා ආන්තික තැන්පතු ලබා ගෙන ඇති බවට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිටසන් කළ යුතුය.
4. ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීම හෝ ශ්‍රී ලංකාවේ බැංකු හරහා ගෙවීම තුළින් සහ නිෂ්කාශනය කළ රේගු ලියවිලි ඉදිරිපත් කිරීම මත ආන්තික තැන්පතු නිදහස් කිරීම සිදු කළ හැකිය.
5. ආනයනයන් සම්බන්ධයෙන් ආන්තික තැන්පතු කිරීමට ආනයනකරුවන්ට ඉඩ සැලසෙන අයුරින් කිසිදු ණය පහසුකමක් ලබා නොදීමට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වගබලා ගත යුතු වේ.

අත්සන් කළේ,
ඒ.ඒ.එම්. තාසිම්
**අධ්‍යක්ෂ - බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

මෙම විධානයේ ඇමුණුම 1 https://www.cbsl.gov.lk/sites/default/files/ cbslweb_documents/laws/cdg/bsd_circular_no_02_of_2018_pdf ඔස්සේ ලබාගත හැක.